# බෞද්ධ, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම්හි කාන්තාවට හිමි ස්ථානය සහ වර්තමාන පසුබිම

ඒ.පී.ඩී. පීරිස් - බෞද්ධ අධ්‍යයනාංශය

බෞද්ධ, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම්වල කාන්තාව උදෙසා නිදහස සහ අයිතිවාසිකම් හිමිකර දී ඇති අතර එම ආගමික ඉගැන්වීම්වල ස්ත්‍රීත්වය අකුසල කර්මයක ප්‍රතිඵලයක් ලෙස සඳහන් නොවූවද වත්මන් සමාජ සංස්කෘතියෙහි ස්ත්‍රීත්වය අකුසල කර්මයක ප්‍රතිඵලයක් ලෙස  සලකා කාන්තා ආගමික අයිතිය සීමාවකට ලක් වී තිබෙන්නේ ඇයි යන පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ. මෙහිදී ප්‍රාථමික සහ  ද්විතියික මූලාශ්‍රගත  ගුණාත්මක දත්ත මගින් තොරතුරු ලබා ගැනීම සිදු විය. තවදුරටත් ක්ෂේත්‍ර පර්යේෂණය සඳහා නිරීක්ෂණ විධික්‍රමය භාවිත විය. මෙම පර්යේෂණය සඳහා උපන්‍යාසය වූයේ බෞද්ධ, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම් මගින් කාන්තාව උදෙසා නිදහස සහ අයිතිවාසිකම් හිමිකොට දී ඇතත් වත්මන් සමාජයෙහි කාන්තාවන්ගේ ආගමික අයිතිය සීමා වී ඇත යන්නයි. පර්යේෂණය අවසානයෙහි මෙම උපන්‍යාසය සනාථ විය. බෞද්ධ සහ ක්‍රිස්තියානි ආගම්හි  පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ට ද සමාන අයිතිවාසිකම් හා ගෞරවාන්විත ජීවිතයක් හිමිකර දී ඇති අතර ඉස්ලාම් ආගමෙහි ද කාන්තාවන්ට අයිතිවාසිකම් හිමිකර දී ඇතත් පුරුෂ මූලිකත්වයක් ඉස්මතු වී ඇති හෙයින් සහ කාන්තාව සම්බන්ධයෙන් පනවා ඇති ආගමික නීතිරීති මගින් කාන්තා නිදහස යම් ප්‍රමාණයකට සීමා වී ඇති ආකාරය හඳුනා ගැනීමට හැකි විය. එසේම වර්තමාන සමාජයේ දී කාන්තාව පිළිබඳ ගොඩනගන ලද ඍණාත්මක ආකල්ප පදනම් කරගෙන කාන්තා අයිති සීමා වී ඇති ආකාරය පිළිබඳවත් අවධානය යොමු කරමින් මෙම ශාස්ත්‍රීය පර්යේෂණය සිදු විය. විශේෂයෙන් වර්තමාන සමාජ සංස්කෘතියෙහි කාන්තා ආගමික අයිතිය සීමාවකට ලක් වීමට සහ ස්ත්‍රීත්වය අකුසල කර්මයක් ලෙස සැලකීමට හේතු වී ඇත්තේ මල්වර වීම, මාසික ඔසප් වීම හා දරු ප්‍රසූතිය වැනි ජීව විද්‍යාත්මක හේතු පදනම් කොට ගෙන එම අවස්ථා 'කිල්ලක්' ලෙස සැලකීම නිසාවෙනි. විශේෂයෙන්ම බෞද්ධ සමාජයේදි කාන්තාවන්ට ශ්‍රී මහා බෝධියට, දළදා පත්තිරිප්පුවට ඇතුළුවීමට අවසර නොමැති අතර ඉස්ලාම් සමාජයේ දී සලාතය ඉටු කිරීමට, හජ් උපවාසය ඉටු කිරීම ආදියට සීමා පැනවී ඇත. ඉහත කී ජීවවිද්‍යාත්මක අපහසුතාවල දී වේදනාකාරී බවක් කාන්තාවට උරුම වී ඇත්තේ අකුසල කර්මයක ප්‍රතිවිපාක දීමක් වශයෙන් බවත් එකී ජීවවිද්‍යාත්මක අවස්ථාවල දී ස්ත්‍රීත්වය අපවිත්‍ර බව සලකා ශුද්ධ වූ ස්ථානවලට ඇතුළුවීම නොකළ යුතු බවටත් සංස්කෘතික සම්මතයක් ගොඩනැගී ඇති අතර එම මතය ආගමික අන්තර්ගතයක් නොවන බවත් සනාථ විය.

***ප්‍රමුඛ පද:*** *කාන්තා නිදහස, කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රීත්වය, අපවිත්‍රත්වය, සලාතය*